# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2364/37 - 2023 දෙසැම්බර් මස 31 වැනි ඉරිදා - 2023.12.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම *ගැසට්* නිවේදනය මගින් 2023 සැප්තැම්බර් 21 දිනැති අංක 2350/45 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් අවසන් වරට සංශෝධනය කරන ලද 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/67 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ සඳහන් නියෝගය එහි IV වන උපලේඛනයට මෙම උපලේඛනයෙහි I හා II වන තීරුවල නිශ්චිතව සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ සහ සංයෝජිත වර්ගීකරණ සංකේත යටතේ ඊට අනුරූපව III වැනි තීරුවේ සඳහන් වූ විස්තරය යටතේ නිශ්චිතව දක්වා ඇති අයිතම, මෙම උපලේඛනයේ IV වන තීරුවේ සඳහන් පරිදි ඇතුළත් කරමින් සංශෝධනය කරමි.

02. මෙම නියෝගය 2024 ජනවාරි 01 දින සිට බලපැවැත්වේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


1A - PG 6598 — 456 (2024/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංකය *(I)* | සංයෝජිත වර්ගීකරණ සංකේතය *(II)* | විස්තරය *(III)* | සහනදායී අනුපාතය *(III)* |
|---|---|---|---|
| 2710 | 27101221 | ඔක්ටේන් අංක 92 සහිත පැට්‍රෝල් | නිදහස් |
| 2710 | 27101222 | ඔක්ටේන් අංක 95 සහිත පැට්‍රෝල් | නිදහස් |
| 2710 | 27101229 | අනෙකුත් | නිදහස් |
| 2710 | 27101941 | කිලෝග්‍රෑම් 1 කට මිලිග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10 ට නොවැඩි ගෙන්දගම් අඩංගු සුපිරි ඩීසල් | නිදහස් |
| 2710 | 27101942 | කිලෝග්‍රෑම් 1 කට මිලිග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10 ට වැඩි නමුත් කිලෝග්‍රෑම් 1කට මිලිග්‍රෑම් (මිලියන එකකට කොටස්) 500 ට නොවැඩි ගෙන්දගම් අඩංගු අනෙකුත් ඩීසල් වර්ග | නිදහස් |
| 2710 | 27101949 | අනෙකුත් | නිදහස් |
| 2711 | 27111910 | ද්‍රවීකරණය කළ පොට්‍රෝලියම් වායු | නිදහස් |
| 3102 | 31021000 | ජලීය සංයෝගයකින් යුක්ත වූ හෝ නොවූ යූරියා | නිදහස් |
| 3102 | 31022100 | ඇමෝනියම් සල්ෆේට් | නිදහස් |
| 3102 | 31022900 | අනෙකුත් | නිදහස් |
| 3102 | 31023000 | ජලීය සංයෝගයකින් යුක්ත වූ හෝ නොවූ ඇමෝනියම් නයිට්‍රේට් | නිදහස් |
| 3102 | 31024000 | කැල්සියම් කාබනේට් හෝ අනෙකුත් අකාබනික පොහොර නොවන ද්‍රව්‍යයන් සමඟ ඇමෝනියම් නයිට්‍රේට් | නිදහස් |
| 3102 | 31026000 | ද්විත්ව ලවණ සහ කැල්සියම් නයිට්‍රේට් සහ ඇමෝනියම් නයිට්‍රේට් වල සම්මිශ්‍රණය | නිදහස් |
| 3102 | 31029000 | මෙහි ඉහත දක්වෙන උප ශීර්ෂ වල නිශ්චිත ලෙස සඳහන් කොට නොමැති සම්මිශ්‍රණ ඇතුළුව අනෙකුත් | නිදහස් |
| 3103 | 31031100 | 35% හෝ ඊට වැඩි ප්‍රමාණයක බරකින් යුත් ඩයිපොස්ෆරස් පෙන්ටොක්සයිඩ් (පී 2 ඕ 5) අන්තර්ගත | නිදහස් |
| 3103 | 31031900 | අනෙකුත් | නිදහස් |
| 3104 | 31042000 | පොටෑසියම් ක්ලෝරයිඩ් | නිදහස් |
| 3104 | 31043000 | පොටෑසියම් සල්ෆේට් | නිදහස් |
| 3104 | 31049000 | අනෙකුත් | නිදහස් |
| 3105 | 31052000 | නයිට්‍රජන්, පොස්ෆරස් සහ පොටෑසියම් යන මූලද්‍රව්‍යයන් තුනක් අඩංගු වූ ඛණිජමය හෝ රසායනික පොහොර | නිදහස් |
| 3105 | 31053000 | ඩයි ඇමෝනියම් හයිඩ්‍රජන්ඔතෝ ෆොස්පේට් (ඩයි ඇමෝනියම් පොස්ෆේට්) | නිදහස් |
| 3105 | 31054000 | ඇමෝනියම් හයිඩ්‍රජන්ඔතෝ ෆොස්පේට් (මොනොඇමෝනියම් පොස්පේට්) සහ ඒවා ඩයි ඇමෝනියම් හයිඩ්‍රජන්ඔතෝ ෆොස්පේට් (ඩයි ඇමෝනියම් පොස්පේට්) සමඟ වූ ඒවායේ සම්මිශ්‍රණය | නිදහස් |
| 3105 | 31055100 | නයිට්‍රේට් සහ ෆොස්පේට් අන්තර්ගත | නිදහස් |
| 3105 | 31055900 | අනෙකුත් | නිදහස් |
| 3105 | 31056000 | පොස්ෆරස් සහ පොටෑසියම් යන මූලද්‍රව්‍යයන් දෙක අඩංගු වන්නා වූ ඛනිජමය හෝ රසායනික පොහොර | නිදහස් |
| 3105 | 31059000 | අනෙකුත් | නිදහස් |

EOG 01- 0015

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.